
තණකොළ පෙත්තා සහ කූඹියා
එකමත් එක කාලෙක කූඹියෙකුයි තණකොළ පෙත්තෙකුයි
එකම කැලෑවක වාසය කළා.
ග්‍රීස්ම ඍතුව ආරම්භයත් එක්කම කූඹි රාල ඉදිරියේ
එළඹෙන ශීතඍතුව ට සූදානම් වුණා. දවස පුරාම මහන්සි නොබලා
තමන්ට අවශ්‍ය කෑම එක් රැස් කළා, මොකද දන්නවද,
ඒ ඇයි කියලා? තව ටික කාලෙකින්
ශීතඍතුව පටන් ගත්තාම එයාලට
කෑම බීම හිහ වෙන බව
එයා දැනගෙන සිටියා.



ඒත් ඒ කිසිම දෙයක් කල්පනා නොකල තණකොළ පෙත්තා
සුපුරුදු ලෙස නටලා, වයලා, සිංදු කියලා දවස ඉතා සතුටින්
ගත කළා,එයා නිකමට වත් හිතුවෙ නැහැ ඉදිරියට එළඹෙන
ශ්‍රීතසෘතුව ගැන.

එක දවසක් මහන්සි නොබලා වැඩ කරන කූඹි රාල ගෙන්
තණකොළ පෙත්තා අහනවා
“ඇයි කූඹි රාල දවස පුරාම මහන්සි වෙන්නෙ,
මම වගේ සතුටින් දවස ගෙවන්නෙ නැතිව.”
ඉතින් කූඹි රාළ කිව්වා“ මම ඉස්සරහ ට
එන ශ්‍රීතසෘතුව ට සූදානම් වෙනවා.
ඇයි දන්නෙ නැද්ද ඒ කාලෙට කෑම හොයන්න
බැහැ නේද?”



එතකොට කූඹි රාලට හිනාවෙමින් තණකොළ පෙත්තා මෙන්න මෙහෙම කීවා. "නෑ නෑ ඒ කාලයට අපිට කෑම හොයා ගන්න එක ප්‍රශ්නයක් නෙමෙයි එතකොට ඒක බලමු කියා නැවතත් සුපුරුදු ලෙස සිංදු කියමින් නටන්න පටන් ගත්තා."

එයා හැම වෙලාවෙම හිතුවෙ එදා දවස සතුටින් ඉන්න එක ගැන විතරයි.



ඉතින් ඔන්න ශ්‍රීතසෘතුව එළඹුනා.

දැන් දුරදිග කල්පනා කල කූඹි රාල ඉතා සතුටින්
ශ්‍රීත සෘතුවෙ කාලාබීලා යාළුවොත් එක්ක එයාලගෙ කූඹි ගුලේ හිටියා.

ඒත් තණකොළ පෙත්ත ට සිදු වූ දේ.....එයා
ඉතින් සීතලේ වෙවුල වෙවුල එයා හැම තැනම ඇවිදලත් කැමට
කිසිම දෙයක් ලැබුනෙ නැහැ.
දැන් මොකද කරන්නෙ කියල සිතූ තණකොළ පෙත්තා ඉතා අමාරුවෙන්
වෙවුල වෙවුල කූඹි රාල හොයාගෙන ගියා.
අනේ මට කැමට මුකුත්ම නැහැ තවත් මට ඇවිද ගන්නත් අමාරුයි කියලා
හයියෙන් ඇඬුවා.



කූඹි රාල කීප විටක්ම ග්‍රීස්ම ඍතුවෙදි තණකොල පෙත්තාට මතක් කළා ඉදිරි

කාලයේදි කෑමබීම හිඟ වීම ගැන....

දැන් පේනවා නේද සිදු වූ දේ....

ඉතින්පුංචි අපි හිතන්න ඕන කූඹි රාල වගේ ඉදිරිය සැලසුම් කරගන්න එහෙම

නොවුනොත් අපිටත් අනාගතේ අඩන්න වේවි.